# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,646 - 2010 මාර්තු මස 19 වැනි සිකුරාදා - 2010.03.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | — | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 423 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලු ම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 මාර්තු මස 26 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 මාර්තු මස 12 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය.

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම.
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඞ්බෝඞ් පෑඩ්, නැවු ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක වක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය,
බත්තරමුල්ල,
පැලවත්ත.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

### සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
### ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II පන්තියේ 'ආ' ශ්‍රේණියේ
### පර්යේෂණ සහකාරවරුන් බඳවා ගැනීම - 2009

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II පන්තියේ 'ආ' ශ්‍රේණියේ පර්යේෂණ සහකාරවරුන් බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවමින් 2009.10.09 දිනැති අංක 1623 දරන *ගැසට් පත්‍රය* මගින් නිකුත් කරන ලද නිවේදනයේ 02, 06 හා 09 ඡේද පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

02. *විභාගය* - 2010 අප්‍රේල් මාසයේ දී සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් මහනුවර දී මෙම විභාගය පවත්වනු ලැබේ. මෙම විභාගය කල්දැමීම හෝ අවලංගු කිරීමට සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ට බලය ඇත.

06. *අධ්‍යාපන සුදුසුකම්* - 2010.03.31 වැනි දිනට පහත සඳහන් සුදුසුකම් සපුරාලිය යුතුය.

09. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය*.-

(1) ඉල්ලුම්පත්‍රය 2009.10.09 වැනි දිනැති *ගැසට් නිවේදනයේ* පළ කරන ලද ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. අඟල් 8 1/2 x 12 (A4) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් සකස් කර ගත් ඉල්ලුම් පත්‍රය 2010.03.31 දිනට පෙර අධ්‍යක්ෂ ජනරාල්, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, තැ. පෙ. 13, ගැටඹේ, පේරාදෙණිය යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ "පර්යේෂණ සහකාර තනතුරට බඳවා ගැනීමේ තරග විභාගය" යනුවෙන් පැහැදිළිව සටහන් කළයුතු වේ. මෙදිනට පසුව ලැබෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

එච්. එම්. එස්. පී. හේරත්,
සත්ව නිෂ්පාදන හා
සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්.

2010 පෙබරවාරි මස 05 වැනි දින,
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.

03-709

---

## පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ II වැනි පන්තියේ II වැනි ශ්‍රේණියේ පශුවෛද්‍ය නිලධාරි හා පශු පර්යේෂණ නිලධාරි තනතුරු පුරප්පාඩුවලට නිලධාරීන් බඳවා ගැනීම සඳහා අයදුම්පත්‍ර කැඳවීම - 2010

ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සෙවයේ II වැනි පන්තියේ II වැනි ශ්‍රේණියේ පශු වෛද්‍ය නිලධාරි සහ පශු පර්යේෂණ නිලධාරි තනතුරුවල 2010.06.30 දිනට පවතින පුරප්පාඩුවලට පත්කිරීමට සුදුස්සන් තෝරාගැනීම සඳහා පශු වෛද්‍ය උපාධිධාරීන්ගේ අයදුම්පත්‍ර කැඳවනු ලැබේ. මෙම නිවේදනයට යා කොට ඇති ආදර්ශ ආකෘතියට අනුව A-4 ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් පිළියෙල කර ගත් අයදුම්පත් 2010.04.30 වැනි දිනට හෝ ඊට පෙර

අධ්‍යක්ෂ ජනරාල්,
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 13,
ගැටඹේ,
පේරාදෙණිය.
යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

*සටහන්* :

(i) ඉල්ලුම් පත්‍රයක් හෝ සම්බන්ධ ලිපියක් තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි පාඩුව අයදුම්කරුවන් විසින්ම දරා ගත යුතු අතර, ඉල්ලුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ II වැනි පන්තියේ II වැනි ශ්‍රේණියේ පශු වෛද්‍ය නිලධාරි/පශු පර්යේෂණ නිලධාරි තනතුර" යනුවෙන් සඳහන් කළ යුතුය. (තමා අයදුම් කරන තනතුර පමණක් සටහන් කළ යුතුය.)

(ii) මූලික සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(iii) පශු වෛද්‍ය නිලධාරි තනතුරු සඳහා බඳවා ගනු ලබන්නන් පත්වීමේ දින සිට අවුරුදු 5 ක කාලයක් උතුරු හා නැගෙනහිර පළාත්වල සේවය කළ යුතුය.

02. සේවයේ නියුක්ත කරවීමේ නියමයන් හා සේවා කොන්දේසි :

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තේරී පත්වන අයදුම්කරුවන් වැන්දඹු,/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) තෝරා ගනු ලබන අයදුම්කරුවන් ඔවුන් විසින් අයදුම්කරනු ලබන ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවාවේ උපලේඛනගත තනතුරක් පිරවීම සඳහා පත් කරනු ලැබේ.

(iii) සෙසු සේවා නියුක්ත නියමයන් සහ සේවා කොන්දේසි 1980.10.31 වැනි දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ හා වරින්වර නිකුත් කරන ලද සංශෝධන නියමයන් සහ ලංකාණ්ඩුවේ ආයතන සංග්‍රහයේ විධිවිධාන, අංක 1589/30 හා 2009.02.20 දිනැති *ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා රීති හා වරින්වර නිකුත් කරනු ලබන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල නියමයන් පරිදි වේ.

03. *වැටුප් ක්‍රමය* :-

ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ II වැනි පන්තියේ II වැනි ශ්‍රේණියේ තනතුරු සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 අනුව SL- 1-2006 වැටුප් පරිමාණයේ (රු.22,935,10 x 645 - 8 x 790 - 17 x 1,050 - 53,555 වැටුප් පරිමාණයේ) පියවර 1 සිට 11 දක්වා හිමිවන අතර, එම චක්‍රලේඛයේ විධිවිධාන අනුව වැටුප් ගෙවනු ලැබේ. මෙම වැටුප් ක්‍රමයේ 4 වැනි වැටුප් පියවරට එළඹීමට පෙර පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම්

පරීක්ෂණය ද 7 වැනි වැටුප් පියවරට එළඹීමට පෙර දෙවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය ද සමත් විය යුතුය.

04. *බඳවා ගැනීම සඳහා පොදු සුදුසුකම් :-*

I. (අ) සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.

(ආ) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 20 ට නොඅඩු විය යුතු අතර උපරිම වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

(ඇ) පශ්චාත් උපාධි සුදුසුකම් සහිත අපේක්ෂකයින් සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව අවුරුදු 40 ක් වනු ඇත.

(ඈ) මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු අතර, මනා ශරීර සෞඛ්‍ය තත්ත්වය වෛද්‍ය පරීක්ෂණ වාර්තාවක් මගින් සනාථ විය යුතුය.

(ඉ) පශු වෛද්‍ය උපාධිධාරීන් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර ශ්‍රී ලංකා පශු වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී තිබිය යුතුය.

05. *අධ්‍යාපන සුදුසුකම් :-*

(i) පශු වෛද්‍ය නිලධාරීන් -
පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් පශු වෛද්‍ය විද්‍යාව පිළිබඳ සිව් අවුරුදු උපාධියක්,

(ii) පශු පර්යේෂණ නිලධාරීන්-
පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් පශු වෛද්‍ය විද්‍යාව පිළිබඳ සිව් අවුරුදු පළමු පෙල හෝ දෙවැනි පෙළ ඉහළ උපාධියක්.

*සටහන :*

(i.) බඳවා ගැනීම් සඳහා ඉදිරිපත් වන අයදුම්කරුවන් ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දින හෝ ඊට පෙර මූලික අධ්‍යාපන සුදුසුකම් ලෙසට නියම කර ඇති උපාධිය සම්බන්ධයෙන් වූ පූර්ණ සුදුසුකම් ලබාගෙන සිටිය යුතුය. මේ සඳහා උපාධි සහතිකයේ වලංගු වන දිනය ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනය හෝ ඊට පෙර දිනයක් විය යුතුය.

(ii.) ප්‍රතිඵල අපේක්ෂාවෙන් ඉදිරිපත් කරන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06. *බඳවා ගැනීමේ ක්‍රමය :-*

(අ) පශු වෛද්‍ය නිලධාරි හා පශු පර්යෂණ නිලධාරි තනතුරුවල පවතින පුරප්පාඩු සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පශු වෛද්‍ය පීඨය විසින් ප්‍රකාශයට පත් කරනු ලබන කුසලතා ලේඛනය මත බඳවා ගනු ලබනවා ඇත. පිළිගත් විදේශ විශ්ව විද්‍යාලයකින් පශු වෛද්‍ය උපාධි සුදුසුකම් ලබා ගන්නා අයදුම්කරුවන් ශ්‍රී ලංකා පශු වෛද්‍ය සභාවේ ලියාපදිංචිය සඳහා සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන වසරට අදාළව ලියාපදිංචි දිනය අනුව අනුපිළිවෙලින්, කුසලතා ලේඛනයේ අවසානයට ඇතුලත් කරනු ඇත.

(ආ) එක් අයදුම්කරුවෙකුට නියමිත සුදුසුකම් තිබේ නම්, පශු වෛද්‍ය නිලධාරි හා පශු පර්යේෂණ නිලධාරි යන තනතුරු දෙක සඳහාම වෙන් වෙන් වශයෙන් අයදුම්කළ හැක.

(ඇ) කුසලතා ලේඛනයේ අනුපිළිවෙල අනුව වෙන් කර ඇති පුරප්පාඩු සංඛ්‍යාව පදනම් කර ගනිමින් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා අදාළ බඳවා ගැනීම් සිදු කරනු ඇත. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දීමක් සිදු නොකෙරේ.

07. සම්මුඛ පරීක්ෂණය සඳහා දැනුම්දුන්විට පහත සඳහන් ලියවිලි වල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

(i) උප්පැන්න සහතිකය
(ii) උපාධිය හා /හෝ උසස්ම අධ්‍යාපන සහතිකය
(iii) මෑතකදී ලබා ගත් චරිත සහතික දෙකක්
(මින් එකක් පාඨමාලා පිළිබඳ අධ්‍යක්ෂගෙන්, විශ්වවිද්‍යාලීය මහාචාර්යවරයාගෙන්, හෝ ආචාර්ය වරයාගෙන් විය යුතුය.)
(iv) සිංහල/දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් සමත් වූ උසස්ම විභාගවල සහතික
(v) පශු වෛද්‍යවරයෙකු වශයෙන් ශ්‍රී ලංකා පශු වෛද්‍ය සභාවේ ලියාපදිංචි වීමේ සහතිකය

08. *වෙනත් විධිවිධාන :-*

(i) මෙම *ගැසට් නිවේදනයේ* විධිවිධාන පනවා නොමැති කරුණු සම්බන්ධයෙන් තීරණ ගැනීමේ බලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වනු ඇත.

(ii) පුරප්පාඩු පිරවීම නොපිරවීම හෝ කොටසක් පමණක් පිරවීම පිළිබඳ අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

(iii) මෙම *ගැසට් නිවේදනයේ* සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨ බල පැවැත්විය යුතුය.

(iv) අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු වනු ඇත.

(v) අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමින් යටපත් කර ඇති නම් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

සුනිමල් සේනාරත්න,
ලේකම්,
පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය.

2010 පෙබරවාරි මස 26 වැනි දින,
කොළඹ 03,
අංක 45, ශාන්ත මයිකල් පාර,
පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

**ආදර්ශ අයදුම්පත**

ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ II වැනි පන්තියේ II වැනි ශ්‍රේණියේ පශු වෛද්‍ය නිලධාරි/ පශු පර්යේෂණ නිලධාරි පුරප්පාඩුවලට බඳවා ගැනීමේ අයදුම්පත

(කාර්යාල ප්‍රායෝජනය සඳහා)

01. (i) මුලකුරු සමග නම ෘ
සිංහලෙන් :————.
ඉංග්‍රීසියෙන් (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ෘ

02. ජාතික හැඳුනුම්පත් අංකය :

03. තැපැල් ලිපිනය :————.
(ලිපිනයෙහි යම් වෙනසක් සිදු වුවහොත්, වහාම ඒ බව දැනුම් දිය යුතුය.)

04. ස්ථිර පදිංචි ස්ථානය අයත් -
(i) පළාත් සභාව :————.
(ii) දිස්ත්‍රික්කය :————.

05. උපන් දිනය ෘ වර්ෂය :————. මාසය :————. දිනය :————.
අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස ෘ
අවුරුදු :————. මාස :————. දින :————.

06. (අ) ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද යන බව :————.
(ආ) ජාතිය (සිංහල/ශ්‍රී ලංකා ද්‍රවිඩ/ඉන්දියානු ද්‍රවිඩ/මුස්ලිම්/වෙනත්) :————.

07. (අ) ස්ත්‍රී/පුරුෂ භාවය :————.
(ආ) විවාහක/අවිවාහක/වැන්දඹු ද යන වග :————.

08. අධ්‍යාපන සුදුසුකම් ෘ

| සමත් වූ උපාධිය/ පශ්චාත් උපාධි සුදුසුකම | පන්තිය | විශ්වවිද්‍යාලය | වර්ෂය |
|---|---|---|---|
| 1.<br>2.<br>3. | | | |

09. ශ්‍රී ලංකා පශු වෛද්‍ය සභාවේ ලියාපදිංචි අංකය හා දිනය :———.

10. සේවා විස්තර. (දැනට ස්ථිර තනතුරක් දරන්නේ නම්)

| දැනට දරන තනතුර | සේවා කාලය | | සේවා ස්ථානය | දෙපාර්තමේන්තුව/ පළාත් සභාව |
|---|---|---|---|---|
| | සිට | දක්වා | | |
| | | | | |

11. ඔබ තනතුරු එකකට වඩා අයදුම් කරන්නේ නම් තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු ඔබේ මනාප අනුපිළිවෙල දක්වන්න.

(i) ————.

(ii) ————.

12. මෙම ඉල්ලුම්පත්‍රයෙහි මවිසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු සත්‍යවූත්, නිවැරදිවූත්, ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි ඒවා බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සකු වීමට යටත්වන බවත්, පත්කිරීමෙන් පසුව ඒ බව දැනගතහොත් මා කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකිරීමට යටත්වන බවත් මම දැන සිටිමි. මම කිසිදු උසාවියකින් සාපරාධී වරදකට වැරදිකරුවකු වී නොමැති බව ද මගේ සුපුරුදු අත්සන තබා මින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

(දැනට ස්ථිර තනතුරක් දරන අපේක්ෂකයන්ට පමණක් අදාළ වේ.)

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

ඉහත අයදුම්කරු වූ .................................. මහතා/මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ/ .................................. පළාත් සභාවේ .......................... තනතුරක් දරන නිලධාරිවරයෙකු බවත් ඉල්ලුම්පත්‍රයේ සඳහන් තොරතුරු ඔහුගේ/ඇයගේ පෞද්ගලික ලිපිගොණුව අනුව නිවැරදි බවත් සහතික කරමි. මෙම තනතුර සඳහා මෙම නිලධාරියා තේරී පත්වුවහොත් ඔහු/ඇය මෙම දෙපාර්තමේන්තුවෙන්/පළාත් රාජ්‍ය සේවයෙන් මුදා හැරීමට හැකි/නොහැකි බවත් දන්වමි. (අදාළ නොවන වචන කපා හරින්න.)

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියා
(නිල මුද්‍රාව).

දිනය :————.
ලිපිනය :————.

03-710

---

**පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය**

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා පශු සම්පත් සංවර්ධන නිලධාරි සේවයේ II පන්තියේ 'ආ' ශ්‍රේණියට බඳවා ගැනීම - 2009

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා පශු සම්පත් සංවර්ධන නිලධාරි සේවයේ II පන්තියේ 'ආ' ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවමින් 2009.10.09 දිනැති අංක 1623 දරන ගැසට් පත්‍රය මගින් නිකුත් කරන ලද නිවේදනයේ 02, 06 හා 09 ඡේද පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

02. විභාගය : 2010 අප්‍රේල් මාසයේදී සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් මහනුවරදී මෙම විභාගය පවත්වනු ලැබේ. මෙම විභාගය කල්දැමීම හෝ අවලංගු කිරීමට සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ට බලය ඇත.

06. අධ්‍යාපන සුදුසුකම් - 2010.03.31 දිනට පහත සඳහන් සුදුසුකම් සුපරාලිය යුතුය.

09. ඉල්ලුම්කිරීමේ ක්‍රමය.-

(1) ඉල්ලුම්පත්‍රය 2009.10.09 දිනැති *ගැසට් නිවේදනයේ* පළ කරන ලද ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. අඟල් 8 1/2 x 12 (A4) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් සකස් කර ගත් ඉල්ලුම් පත්‍රය 2010.03.31 දිනට පෙර අධ්‍යක්ෂ ජනරාල්, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, තැ. පෙ. 13, ගැටඹේ, පේරාදෙණිය යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත බහාලන කවරයේ වම් පස ඉහල කෙලවරේ "පශු සම්පත් සංවර්ධන නිලධාරි තනතුරට බඳවා ගැනීමේ තරග විභාගය" යනුවෙන් පැහැදිළිව සටහන් කළ යුතු වේ. මෙදිනට පසුව ලැබෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

එච්. එම්. එස්. පී. හේරත්,
සත්ව නිෂ්පාදන හා
සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්.

2010 පෙබරවාරි මස 5 දින,
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.

03-711

---

**ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් සඳහා වූ 1 වැනි හා 2 වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය සහ දෙවැනි භාෂාව පිළිබඳ පරීක්ෂණ - 2010**

ඉහත සේවයේ නිලධාරීන් සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් හා දෙවැනි භාෂාව පිළිබඳ පරීක්ෂණ 2010 ජුනි මස කොළඹ දී සහ විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලයන් හි දී පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. කාර්යක්ෂමතා කඩඉම් විභාග දෙකටම එකවර ඉදිරිපත්වීමට හැකිවන පරිදි කාලසටහන් සකස් කරනු ලැබේ.

03. විෂය නිර්දේශය - 1 වැනි හා II වැනි කාර්යක්ෂමතා කඩඉම් පාලනය කරන විෂය නිර්දේශ පත්‍ර හා අනෙකුත් විධිවිධාන ශ්‍රී ලංකා විදේශ සේවා ව්‍යවස්ථාවෙහි අන්තර්ගත වී ඇත.

දෙවැනි භාෂා පරීක්ෂණයට අදාළ විෂය නිර්දේශයන් හා අනෙකුත් විධිවිධාන ඇමුණුම් "අ" හි ද, ශ්‍රී ලංකා විදේශ සේවයේ I වැනි සහ II වැනි කාර්යක්ෂමතා කඩඉම්වලට අදාළ විෂය නිර්දේශ හා විධිවිධාන ඇමුණුම් "ආ" හි ද දක්වා ඇත.

කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ විෂයන් සඳහා එකම වාරයක දී හෝ වෙන් වෙන් වශයෙන් වාර කිහිපයකදී ඔවුන්ගේ කැමැත්ත අනුව පෙනී සිටීමට නිලධාරීන්ට අවසර තිබේ. දෙවැනි භාෂා විෂයයට පෙනී සිටින නිලධාරීන් සඳහා වූ වාචික පරීක්ෂණය එකම ස්ථානයකදී එකම වේලාවේ දී පැවැත්වීමට කටයුතු කරනු ඇත.

**ශ්‍රී ලංකා විදේශ සේවය**

04. කාර්යක්ෂමතා කඩඉම් සඳහා පෙනී සිටිය යුතු විෂයන් මෙසේ ය.

1 වැනි කාර්යක්ෂමතා කඩඉම | 2 වැනි කාර්යක්ෂමතා කඩඉම

| *විෂය අංකය* | *විෂය* | *කාලසීමාව පැය* | *විෂය අංකය* | *විෂය* | *කාලසීමාව පැය* |
|---|---|---|---|---|---|
| 1 වැනි කොටස | | | 1 වැනි කොටස | | |
| 01. | මුදල් | 03 | 21 | ශ්‍රීලංකා ආර්ථික හා සමාජ සංවර්ධනය | 03 |
| 02. | ශ්‍රී ලංකාවේ ඉතිහාසය සහ භූගෝලය | 03 | 22 | පරිපාලනය (අ) කාර්යාල ක්‍රම හා සංවිධාන ක්‍රම (ආ) ආයතන සංග්‍රහය (I හා II වෙළුම) | 03 |
| II වැනි කොටස | | | II වැනි කොටස | | |
| 03. | මුලික ආණ්ඩුක්‍රම නීතිය සහ ජාත්‍යන්තර නීතිය | 03 | 23 | මුලික ආණ්ඩුක්‍රම නීතිය සහ ජාත්‍යන්තර නීතිය | 03 |
| 04. | රාජ්‍ය තාන්ත්‍රික පරිචය | 03 | 24 | රාජ්‍ය තාන්ත්‍රික පරිචය | 03 |
| 05. | ජාත්‍යන්තර කටයුතු | 03 | 25 | ජාත්‍යන්තර කටයුතු | 03 |
| 06. | ශ්‍රී ලංකා විදේශ සේවා ව්‍යවස්ථාව,විදේශ සේවා අමාත්‍යාංශ රෙගුලාසි, පරිගණක ප්‍රගුණතාව | 03 | | | |

**විදේශ භාෂා**

| *විෂය අංකය* | *විෂය* | *කාලසීමාව පැය* |
|---|---|---|
| 07. | අරාබි | 02 |
| 08. | ප්‍රංශ | 02 |
| 09. | රුසියානු | 02 |
| 10. | ස්පාඤ්ඤ | 02 |
| 11. | හින්දි | 02 |
| 12. | චීන | 02 |
| 13. | ජර්මන් | 02 |
| 14. | ජපන් | 02 |
| 15. | ඉංග්‍රීසි | 02 |

දෙවැනි භාෂාව සඳහා වන විෂය හා විෂය අංක

| | | |
|---|---|---|
| 30. | සිංහල (ලිඛිත) | 02 |
| 31. | දෙමළ (ලිඛිත) | 02 |
| 32. | ඉංග්‍රීසි (ලිඛිත) | 02 |
| 33. | සිංහල (වාචික) | |
| 34. | දෙමළ (වාචික) | |
| 35. | ඉංග්‍රීසි (වාචික) | |

05. මෙම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණවලට පෙනී සිටින නිලධාරීන්ගේ අවධානය පහත උපුටා දක්වා ඇති 1966 සැප්තැම්බර් මස 04 වැනි දින හා අංක 701 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 5 වැනි ඡේදය කෙරෙහි යොමු කරවනු ලැබේ.

"දෙපාර්තමේන්තුගත විභාග (උසස් කිරීමේ හා කාර්යක්ෂමතා කඩඉම් විභාග ඇතුළු) උසස් කිරීමේ විභාගවලට මෙන්ම කාර්යක්ෂමතා කඩඉම් විභාගවලටද මාධ්‍ය විය යුත්තේ, නිලධාරියා රජයේ සේවයට ඇතුළත්වීමට පෙනී සිටි තරග විභාගයේ මාධ්‍ය හෝ රාජ්‍ය භාෂාවය. තරග විභාගයක් නොමැතිව මුලින්ම සේවයට බැඳුණු අය සම්බන්ධයෙන් වූ විට උසස් කිරීමේ හා කාර්යක්ෂමතා කඩඉම් විභාගවලට මාධ්‍යය විය යුත්තේ නිලධාරියා සේවයට සුදුසුකම් ලත් භාෂාව හෝ රාජ්‍ය භාෂාවය."

06. විදේශ භාෂා හැර අනෙකුත් ප්‍රශ්න පත්‍රවලට සිංහලෙන්, දෙමළෙන් හෝ ඉංග්‍රිසියෙන් පිළිතුරු සැපයීමට අපේක්ෂකයිනට හැකිවනු පිණිස විභාග කොමසාරිස් ජනරාල් කටයුතු කරනු ඇත. ඉල්ලුම්කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

07. අපේක්ෂකයෙක් තමාට හිමිකම් නොමැති මාධ්‍යයකින් විභාගයට පෙනී සිටි බැව් පසුව හෙළි වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

08. අයදුම් පත්‍ර, අනුබද්ධ ආකෘතියට අනුව, ඒ 4 පත්‍රයක සකස් කොට ඉදිරිපත් කළ යුතුය. ඒ 4 පත්‍රයේ දෙපැත්තම පාවිච්චි කළ යුතුය. විභාග දෙකට ම පෙනී සිටින අයදුම්කරුවන් ඒ ඒ විභාගය සඳහා වෙන වෙන ම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. ඉල්ලුම්පත්‍රයේ ශීර්ෂ අංක 1 සිට 8 දක්වා පළවැනි පිටුවට ද ඉතිරිය දෙවැනි පිටුවට ද ඇතුලත් වන සේ අයදුම්පත් සකස් කරගත යුතුය. ඊට අදාළ තොරතුරු තම අත් අකුරින්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. (ඉල්ලුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද යෙදීමට සටහන් කරගන්න) ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඔබ විසින් ඉදිරිපත් කරන ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

09. විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම සඳහා ඔහු විසින් පනවා ඇති නීතිරීති පිළිපැදීමට අපේක්ෂකයෝ බැඳී සිටිති.

10. සියලුම අයදුම්කරුවන් තමන්ගේ ඉල්ලුම්පත් 2010.04.16 දින හෝ ඊට පෙර, විභාග කොමසාරිස් ජනරාල්ට යැවීමට හැකිවන පරිදි විදේශ අමාත්‍යාංශයේ විදේශ දූතමණ්ඩල පාලන ශාඛාවට එවිය යුතුය. (විදේශ දූත මණ්ඩලවල සේවය කරන අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් දූත මණ්ඩල ප්‍රධානීන් මාර්ගයෙන් එවීමට කටයුතු කළ යුතුය.) ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප වනු ඇත.

11. යම්කිසි අපේක්ෂකයකුට, තමාගේ ප්‍රවේශ පත්‍රය නොලැබුණහොත්, ඔහු විසින් ඒ බව අප්‍රමාදව විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, පැලවත්ත, බත්තරමුල්ල, වෙත දැනුම් දිය යුතුය. (විදුලි පණිවුඩ යවන ලිපිනය : විභාග බත්තරමුල්ල යනුවෙනි) ප්‍රවේශ පත්‍ර නොලැබුණු බව විභාග කොමසාරිස් වෙත දැනුම් දීමේ දී, පහත දැක්වෙන තොරතුරු ද සැපයිය යුතුය.

(i) විභාගයේ නම ;
(ii) සම්පූර්ණ නම ;
(iii) සම්පූර්ණ ලිපිනය.

නුදුරුව පදිංචිව සිටින අයදුම්කරුවන් විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාව වෙත පැමිණ දැනුම් දීමට කටයුතු කළහැකි බවට උපදෙස් දෙනු ලැබේ.

12. ඉහත 11 වැනි ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවන් සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් විසින් පසුව ඉදිරිපත් කෙරෙන ලියකියවිලි සලකා බලනු නොලැබේ.

13. විභාග මධ්‍යස්ථානයේ දී අනන්‍යතාව සනාථ කරනු සඳහා පිළිගනු ලබන ලියවිලි මෙසේ ය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රයක්

14. පළමුවැනි වතාවට මෙම විභාගයට පෙනී සිටින සිසුන් විභාග ගාස්තුවලින් නිදහස් වන අතර ඉන්පසුව පෙනී සිටින වතාවක දී පහත දක්වා ඇති විභාග ගාස්තු ගෙවිය යුතුය.

(අ) පළමුවැනි වතාව (සම්පූර්ණ විභාගය හෝ කොටසක්) සඳහා ගාස්තු අය නොකෙරේ.

| | | |
|---|---|---|
| (ආ) | ඉන්පසු එක් එක් වතාව සඳහා | රු. ශත |
| | සම්පූර්ණ විභාගය සඳහා | 115 0 |
| | එක් විෂයයකට | 70 0 |
| | වාචික පරීක්ෂණයට | 70 0 |

විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ අදායම් ශීර්ෂ 20 - 03 - 20 - 13 ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ලබාගන්නා ලදුපත ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ ඇලවීමට කටයුතු කරන්න.

සී. ආර්. ජයසිංහ,
විදේශ කටයුතු ලේකම්.

විදේශ කටයුතු අමාත්‍යාංශය,
ජනරජ ගොඩනැගිල්ල,
කොළඹ 01.
2010 මාර්තු මස 19 වැනි දින.

ආදර්ශ අයදුම්පත

විදේශ කටයුතු අමාත්‍යාංශය

[ ]
කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් සඳහා වූ 1 වැනි හා 2 වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාග සහ දෙවැනි භාෂාව පිළිබඳව පරීක්ෂණය - 2010

1st and 2nd Efficiency Bar Examination and Second Language Test for the Officers in Sri Lanka Foreign Service - 2010

මාධ්‍යය [ ] සිංහල 2, දෙමළ 3, ඉංග්‍රීසි 4

(කොටුව තුළ අදාළ අංකය සඳහන් කරන්න)

01. (අ) (i) මුල් අකුරු සමග අගට යෙදෙන නම, (සිංහලෙන්/ දෙමළෙන්) :————.

(ii) මුල් අකුරු සමඟ අගට යෙදෙන නම, (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) (අගට යෙදෙන නමට පසුව මුල් අකුරු සඳහන් කරන්න. උදා. (Silva, A. B.) :————.

(ආ) (i) මුල් අකුරුවලින් හැඳින්වෙන නම් (සිංහලෙන්/දෙමළෙන්) :————.

(ii) මුල් අකුරුවලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

02. ලිපිනය (ප්‍රවේශ පත්‍ර එවීම සඳහා :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

03. උපන් දිනය :—

වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

04. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

05. ස්ත්‍රී/පුරුෂ භාවය : ☐ (කරුණාකර කොටුව තුළ අංකය සඳහන් කරන්න. පුරුෂ - 0, ස්ත්‍රී - 1)

06. ශ්‍රී ලංකා විදේශ සේවයට පත් වූ දිනය :

වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

07. වර්තමාන තනතුර

08. පහත වගුවට අනුව නිලධාරියා ඉල්ලුම්කරන විභාගය ☐

(අදාල අංකය කොටුව තුළ සඳහන් කරන්න)

* එක් එක් විභාගය සඳහා වෙන වෙනම අයදුම්පත්‍ර ඉදිරිපත් කළ යුතුය.

| *විභාගය* | *අදාළ අංකය* |
|---|---|
| කාර්යක්ෂමතා කඩඉම 1 | 1 |
| කාර්යක්ෂමතා කඩඉම 2 | 2 |
| දෙවැනි භාෂාව | 3 |
| විදේශ භාෂාව | 4 |

09. නිවේදනයේ 04 වැනි ඡේදයේ දක්වා ඇති අන්දමට ඉල්ලුම්කරන විභාගයට අදාළ විෂයන්ගේ අංක පැහැදිළිව සඳහන් කළ යුතුය. (අයදුම් පත්‍රයේ සඳහන් කර ඇති විෂයන් හැර වෙනත් විෂයන්වලට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ)

| *විෂයය* | *විෂය අංකය* |
|---|---|
| (i) | |
| (ii) | |
| (iii) | |
| (iv) | |
| (v) | |
| (vi) | |

10. මීට ප්‍රථම මෙම විභාගයට මුළුමනින්ම හෝ කොටසක් වශයෙන් හෝ පෙනී සිට ඇත්දැයි සඳහන් කරන්න. එසේ නම් විභාග අංකය, විෂයය, වර්ෂය හා මාසය ද සඳහන් කරන්න.

ඉහත දැක්වෙන විස්තර නිවැරදි බවත් ඉහත දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බවද ප්‍රකාශ කරමි.

විභාග ගාස්තු ගෙවන ලද අංක ……………… දරන කුවිතාන්සිය මෙයට අමුණා ඇත.

ගෙවන ලද විභාග ගාස්තුව රු. ……………

————.
අපේක්ෂකයාගේ අත්සන.

දිනය :————.

මුදල් කුවිතාන්සිය මෙහි ඇලවිය යුතුය.
(කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබාගන්න)

විභාග කොමසාරිස් ජනරාල්,
ඉදිරිපත් කරමි.

ඉහත දැක්වෙන විස්තර නිවැරදි බවත් ………………………… මයා/මිය/මෙනෙවිය, ඔහු/ඇය විසින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සනත් සහතික කරමි.

————.
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන හා තනතුර.

දිනය :————.

පරිශිෂ්ඨය "අ"

**සිංහල**

සිංහල පරීක්ෂණය ලිඛිත හා වාචික යන කොටස්වලින් සමන්විත වේ.

ලිඛිත පරීක්ෂණය පැය 02 ක කාලසීමාවක් සඳහා වන අතර, පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් ප්‍රශ්න එහි අඩංගු වේ.

(i) ව්‍යාකරණ
(ii) සිංහලෙන් ලියන ලද පෙත්සම් හෝ ග්‍රාම සේවා නිලධාරි වාර්තා ඉංග්‍රීසියට පෙරළීම
(iii) ඉංග්‍රීසි රාජකාරි ලිපියකින් හෝ ලේඛනයකින් ගත් කොටසක් සිංහලයට පෙරළීම

වාචික පරීක්ෂණය සඳහා පහත සඳහන් දෑ අඩංගු වේ.

(i) ඉංග්‍රීසියෙන් ලියා ඇති රාජකාරි කරුණු, සිංහල අයෙකු විසින් වටහාගෙන ලියාගත හැකිවන පරිදි සිංහලෙන් කියවීම
(ii) සිංහල භාෂාවෙන් ලියන ලද පෙත්සමක් කියවීම
(iii) කථාව හා භාෂා පරිවර්තනය
මෙම පරීක්ෂණයේ අදහස වනුයේ ඒ ඒ පංතිවල සිංහල තේරුම් ගැනීමට ද, සාමාන්‍ය කථාවේ දී හා සිරිත් පරිදි කෙරෙන රාජකාරි කටයුතුවලදී තමාගේ අදහස් ප්‍රකාශ කිරීමට ද, අපේක්ෂකයාට ඇති හැකියාව මැනීම වේ.

**දෙමළ**

දෙමළ පරීක්ෂණය ලිඛිත හා වාචික යන කොටස්වලින් සමන්විත වේ.

ලිඛිත පරීක්ෂණය පැය 02 ක කාලසීමාවක් සඳහා වන අතර, පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් ප්‍රශ්න එහි අඩංගු වේ :

(i) ව්‍යාකරණ ;
(ii) දෙමළ භාෂාවෙන් ලියන ලද පෙත්සම් හෝ ග්‍රාමසේවා නිලධාරි වාර්තා ඉංග්‍රීසියට පෙරළීම ;
(iii) ඉංග්‍රීසි රාජකාරි ලිපියකින් හෝ ලේඛනයකින් ගත් කොටසක් දෙමළ භාෂාවට පෙරළීම.

වාචික පරීක්ෂණය සඳහා පහත සඳහන් දෑ අඩංගු වේ :

(i) ඉංග්‍රීසියෙන් ලියා ඇති රාජකාරි කරුණු, දෙමළ අයකු විසින් වටහාගෙන ලියාගත හැකිවන පරිදි දෙමළෙන් කියවීම ;
(ii) දෙමළ භාෂාවෙන් ලියන ලද පෙත්සමක් කියවීම ;
(iii) කථාව හා භාෂා පරිවර්තනය.
මෙම පරීක්ෂණයේ අදහස වනුයේ ඒ ඒ පංතිවල දෙමළ තේරුම් ගැනීමට ද සාමාන්‍ය කථාවේ දී හා සිරිත් පරිදි කෙරෙන රාජකාරි කටයුතුවලදී තමාගේ අදහස් ප්‍රකාශ කිරීමට ද, අපේක්ෂකයාට ඇති හැකියාව මැනීම වේ.

**ඉංග්‍රීසි**

ඉංග්‍රීසි ප්‍රශ්න පත්‍රය පැය දෙකක කාලසීමාවක් සඳහා වන අතර, පහත සඳහන් දෑ අඩංගු වේ.

i. ව්‍යාකරණ
ii. අවබෝධය
iii. සාරාංශ ලිවීම
iv. වාර්තා හා ලිපි ලිවීම
v. වාග් මාලාව

ආදර්ශ ප්‍රශ්න පත්‍රයක් අපේක්ෂකයින්ගේ දැනගැනීම සඳහා පහත දක්වා ඇත.

**Part A**

(*a*) Fill in the blanks with the correct form of the verb given within brackets :-

During the last war our country.... 1. (be) a British Colony.... 2 (take) a full part in the war effort. Consequently our tea, rubber and coconut.... 3 (ship) to Britain at very favourable prices and the foreign exchange we... 4 (earn).... 5 (accumalate) as assets. Again during the Korean war in the early fifties our products.... 6 (fetch) good prices and we.... 7 (not have) any exchange problem. However, political independence.... 8 (not given rise) to any effort to.......... 9 (buildup our economy we…… 10 (be) a nation of consumers and we …… 11(Squander) our foreign exchange on consumer goods which..... 12 (can produce) locally and incidentally diversified our economy. Over the last decade we.... 13 (begin) to feel the pinch when our primary products.......... 14 (fail) to command good prices in the world market while our requirements of food both rice and subsidiary food stuffs....... 15 (rise) in price.

(*b*) Fill in the blanks with the correct preposition (where necessary)

As Assistant Secretary......... 16 charge......... 17 subjects, it was my duty to convene groups of officers dealing... 18 different aspects of development work in the Ministry ... 19 time to time. They discussed... 20 various problems that they confronted and which they could not copy... 21 on their own. We were thus able to share our experience.... 22 each other and make concrete proposals........... 23 the Secretary every month. He in turn put.... 24 his own plans for discussion...... 25 these meeting.

(*c*) Underline the correct letters given within brackets that would complete the spelling of the following words.

26. har..ment(rass/as/ass)
27. ember.... (rass/as/ass)
28. tol... (arreance/erance/erence)
29. Par.... arian (liament/limen/liment)
30. bal.... ing (let/lat/lot)
31. itin.... (erary/array/erarie)
32. Pers... (everance/everence/ewerence)
33. bour...(geoise/joursie/juwarsy)
34. Prolet... (ariet/ariat/eriyat)
35. Com.... ate (memorr/emor/memor)

(*d*) In each of the following statements underline the correct word within brackets :-

36. The inventory was checked by the Board of (Survellance/ Survey/Surveyours)
37. At the enquiry I had to be satisfied that the accused officer had (contradicted/contravened/contaminated) the regulations.
38. Every receipt should have a (counterfoil/counterfeit/ counterpane) for the purpose of audit
39. There was a possibility that the prosecution had (fabricated/ fumigated/promulgate) the evidence.
40. (Discrete/Discretionary/Discriminatory) power was given to the Head of the Department under the relevant Act.
41. The Police Party had (laid/lied/lain) in ambush until the bribe taker arrived.
42. The entire staff turned upon (facilitate/infiltrate/felicitate) the watcher on his retirement
43. In times of National crisis we must avoid (luxuriant/luxurious) habits.
44. Martial music wa played over the radio during height of the battle to keep up the (moral/morale/Morals) of the People.
45. Candidates are advised to use (Stationary/Stationery) sparingly owing to the acute, paper shortage.

(*e*) Underline the correct phase in the brackets that means the same as the word or phrase underlined in each sentence :-

46. In good management the boss should, support his staff in their work (back out/back up/back away.)
47. The sales and replacement of stock amounted to over Rs.5,000 (turn out/turn up/turn away).
48. We were warned at the start not to let out work get into arrears (set out/outset)
49. The younger son wasted his father's wealth in a few years (ran over/ran through)
50. I wanted to see the film, but the queue deterred me from going (put away/put off).

**Part B**

Read the following passage carefully and then answer the questions set out below.

Most modern political ideals such, for example, as justice, liberty, constitutional government, and respect for the law or at least the definitions of them, began with the reflection of Greek thinkers upon the institutions of City State. But in the long history of political thought the meaning of such terms has been variously modified and always that meaning has to be understood in the light of the institutions by which the indicates were to be realized and of the society in which those institutions did their work. The Greek City States was so different from the political communities in which modern men live that in requires no small effort of the imagination to picture its social and political life. The Greek Philosophers were thinking of political practices far different from any that have prevailed commonly in modern world, and the whole climate of opinion in which the work was done was different. Their problems though not without their analogies in the preset, were never identical with modern problems, and the ethical apparatus by which political life was evaluated and criticized varied widely from any that now prevails. In order to understand at all accurately what their theories meant is necessary first to realize at least roughly what kind of institutions they had in view and what citizenship connected, as an effect and as an ideal, to the public for whom they wrote. For this purpose the Government of Athens is especially important, partly because it is the best known, but chiefly because it was an object of special concern to the greatest of Greek Philosophers.

As compared with modern states the ancient - City- State was exceedingly small both in area and in population. The numbers were exceedingly uncertain but, a figure somewhat it excess of three hundred thousand would be approximately correct. Such an arrangement of a small territory dominated by a single City was typical off the City State.

In each of the following cases, choose the alternative which in your opinion supports the views expressed in the above passage. Place a tick (right mark) aaginst the correct answer :-

51. Athens is significant for the students of Greek political thought mainly because.

(*a*) It was the most powerfulll of the Greek City-States ;
(*b*) Its ideals had been carefully studied by the Greeks themselves ;
(*c*) It had the most ideal form of Government.

52. Greek political thought was concerned with problems :-

(*a*) entirely unrelated to ;
(*b*) identical with ;
(*c*) different from Analogous but to.

53. The moral and religious basis of Greek Political idea is :-

(*a*) Very similar to modern moral and religious ideas ;
(*b*) unknown ;
(*c*) very different from modern moral and religious ideas.

54. It is :-

(*a*) easy ;
(*b*) not at all easy ;
(*c*) impossible ;
for a modernman to imagine what life was like in a Greek City-State

55. In Comparision with the ancient Greek City States are :-

(*a*) Very large ;
(*b*) Very Small ;
(*c*) about the same size.

56. The population of an ancient Greek City States was :-

(*a*) much less that 300,000 ;
(*b*) over 3 million ;
(*c*) just over 300,000.

57. The City-State of Athens Comparisons :-

(*a*) a small territory governed by a singly city ;
(*b*) a large territory governed by a number of cities ;
(*c*) a small territory with village councils ;
(*d*) a large territory with a decentralized administrations.

58. At different times in the history of the world people :-

(*a*) have thought in basically the same way ;
(*b*) have thought in different ways ;
(*c*) have contradicted the views of people of the previous generation.

59. Details of political theory are derived from Greek Political thought :-

(a) because the Greek City States was very similar to modern states ;
(b) inspite of Greek City State being very different from modern states ;
(c) because modern political theorists are students of Greek Philosophy.

60. The meaning of political ideal at a particular moment in European History since the time of the Greeks can be defined only be :-

(*a*) relating it to its context ;
(*b*) tracing it back its original meaning among the Greeks ;
(*c*) investigating the meaning of the Greek word for it ;
(*d*) taking into account only those features in it which have persisted throught out its history.

61. Write sentences using each of the following words so as to bring out its meaning clearly :- Arbitration, emoluments, etiquette, consolidates hypothetical, retrospective, exigencies, evaluate, review, empower.

**EITHER**

62. Write a letter to the Head of an Educational Institute in an English Speaking Country, setting out the following information in an orderly manner :-

(i) The equivalence of our examination certificate to the certificate specified in this letter cannot be determined as the examining authorities in Sri Lanka have not been consulted by the institution concerned in that country.
(ii) The G. C. E. (Ordinary Level) Credit Pass has been officially equated with an Ordinary Pass in London G. C. E. (Ordinary Level) :-
(iii) The receipt of the letter sent to the Commissioner of Examinations is acknowledged.
(iv) Any further information in this matter may be obtained from the Embassy of the Republic of Sri Lanka in that country.

63. Write a memorandum to the Secretary, Bureau of Standards marking out a case for the adoption of the 24 hours clock in this country stating the advantages of such a measure.

පරිශිෂ්ඨය "ආ"

**ශ්‍රී ලංකා විදේශ සේවයේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය**

01. **පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය**

1.1 පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය කොටස් දෙකකින් සමන්විත වන අතර, අයදුම්කරුවන්ට එකවර හෝ වෙන වෙනම හෝ කොටස් දෙකට පෙනී සිටිය හැකිය.

1.2 I වැනි කොටස - මතු සඳහන් විෂයය යටතේ විභාගය පවත්වනු ලැබේ.

(i) මුදල් - මූල්‍ය ක්‍රම පිළිබඳ විභාගය පහත සඳහන් කරුණු මත පදනම් කරගනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ආණ්ඩුවේ මුදල් රෙගුලාසි 1 වැනි කාණ්ඩය (X වැනි පරිච්ඡේදය හැර)

(ආ) ගෙවී යන වර්ෂයේ ඇස්තමේන්තුව
උදා. ඒවා සකස් කිරීම ශීර්ෂ මූල්‍ය ක්‍රම සහ විසර්ජන පනත්

(ඇ) කච්චේරි මගින් විශේෂයෙන් කර ගෙන යනු ලබන ගිණුම් පිළිබඳ ආඥාපනත්

(ii) ශ්‍රී ලංකාවේ ඉතිහාසය සහ භූගෝලය - මෙය පැය තුනක පත්‍රයකි. සාමාර්ථය සඳහා අයදුම්කරු විසින් 40% ක අවම ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතු වේ.

1.3 II වැනි කොටස - විශේෂ ප්‍රශ්න පත්‍ර

(i) මූලික ආණ්ඩුක්‍රම නීතිය සහ ජාත්‍යන්තර නීතිය
(ii) රාජ්‍යතාන්ත්‍රික පරිචය
(iii) ජාත්‍යන්තර කටයුතු
(iv) ශ්‍රී ලංකා විදේශ සේවා ව්‍යවස්ථාව, විදේශ සේවා අමාත්‍යාංශ රෙගුලාසි සහ පරිගණක හැකියාව

1.3.1 මෙම කොටසෙහි එක් එක් ප්‍රශ්න පත්‍රය පැය තුනක් සඳහා වන අතර, සාමාර්ථය සඳහා අයදුම්කරුවන් විසින් එක් එක් ප්‍රශ්න පත්‍රය යටතේ 40% අවම ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතු වේ.

1.3.2 නිලධාරියෙකුට ඕනෑම වාර ගණනකදී එක් එක් ප්‍රශ්න පත්‍රයට වෙන වෙනම පෙනී සිටිය හැකි අතර, එක් එක් ප්‍රශ්න පත්‍රය සම්බන්ධයෙන් සුදුසුකම් ලැබීමේ ලකුණු ලබාගත් පසු ඔහු/ඇය මෙම කොටසින් සමත්වූවකු ලෙස සලකනු ලැබේ.

සටහන (i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය යටතේ ප්‍රධාන වශයෙන් ප්‍රශ්න නියම කරනු ලබන්නේ, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කෙරෙහි විශේෂ අවධානයෙන් යුතුව, පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයේ විකාශය අළලාය. ද්විපාර්ශ්වික මෙන්ම බහුපාර්ශ්වික දෙගුණයේම අන්තර් රාජ්‍ය සම්බන්ධතා එකිනෙකට අදාළව රාජ්‍යතාන්ත්‍රික නීතිය සහ ගිවිසුම් නීතිය සහ ක්ෂේත්‍ර අළලා ජාත්‍යන්තර නීතිය යටතේ ප්‍රශ්න නියම කරනු ලැබේ.

(ii) නීතිඥවරයෙකු වන්නාවූ හෝ පිළිගත් විශ්වවිද්‍යාලයකින් නීති උපාධියක් ලබා ඇත්තාවූ හෝ නිලධාරියෙකු විභාගයට අදාළ විෂයයවලින් සාමාර්ථය ලබා ඇත්නම්, ඔහු/ඇය මූලික ආණ්ඩුක්‍රම නීතිය හා ජාත්‍යන්තර නීතිය යන ප්‍රශ්න පත්‍රයෙන් නිදහස් කරනු ලබනවා ඇත.

02. **දෙවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය**

2.1 දෙවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය කොටස් දෙකකින් සමන්විත වන අතර, නිලධාරීන්ට කොටස් දෙකට එකවර හෝ වෙනම හෝ පෙනී සිටිය හැක.

2.2 I වැනි කොටස - මතු දැක්වෙන විෂයයන් යටතේ විභාගය පවත්වනු ලැබේ.

(i) ශ්‍රී ලංකා ආර්ථික හා සමාජ සංවර්ධනය
(ii) පරිපාලනය - මෙම ප්‍රශ්න පත්‍රය මතු සඳහන් අංශ යටතේ සකස් කෙරෙනු ඇත.
(අ) කාර්යාල ක්‍රම සහ සංවිධාන ක්‍රම
(ආ) ආයතන සංග්‍රහ I වෙළුම සහ II වෙළුම

2.3 ඉහත සඳහන් එක් එක් ප්‍රශ්න පත්‍රය පැය තුනක කාලසීමා සඳහා සකස් කෙරේ.

සාමාර්ථය සඳහා අයදුම්කරුවන් විසින් එක් එක් ප්‍රශ්න පත්‍රය යටතේ 40% අවම ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතු වේ.

2.4 II වැනි කොටස - විශේෂ ප්‍රශ්න පත්‍ර
(i) මූලික ආණ්ඩුක්‍රම නීතිය හා ජාත්‍යන්තර නිතිය
(ii) රාජ්‍ය තාන්ත්‍රික පරිචය
(iii) ජාත්‍යන්තර කටයුතු

2.5 ඉහත සඳහන් සියල්ලම පැය තුනේ ප්‍රශ්න පත්‍ර වන අතර සාමාර්ථය සඳහා අයදුම්කරුවන් විසින් 40%ක අවම ලකුණු ප්‍රමාණයක් එක් එක් ප්‍රශ්න පත්‍රයෙන් ලබාගත යුතුවේ.

2.6 ඕනෑම වාර ගණනක දී එක් එක් ප්‍රශ්න පත්‍රයට වෙන වෙනම පෙනී සිටීමට අයදුම්කරුවන්ට අවකාශ සැලැසෙන අතර, එක් එක් ප්‍රශ්නපත්‍රය සම්බන්ධයෙන් සුදුසුකම් ලැබීමේ ලකුණු ලබා ගැනීමෙන් පසුව, ඔහු/ඇය එම ප්‍රශ්න පත්‍රයෙන් සමත්වූ ලෙස සලකනු ලැබේ.

*සැ. යු.*—ඉහත සඳහන් විභාගයේ විදේශ භාෂා පිළිබඳ විෂය නිර්දේශය මෙම ගැසට් නිවේදනයේ ඉංග්‍රීසි කොටසේ පළකර ඇත.

03-750

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.